සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

60 | S | I

# දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019

# Second Term Test - Grade 11 - 2019

නම/විභාග අංකය : ............................. ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I කාලය : පැ. 01යි.

උපදෙස්

✳ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

✳ **පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

පාසල් සිසුන්ගේ කලා කුසලතාවයන් වැඩි දියුණු කිරීම සඳහා සුචරිත මහා විද්‍යාලයේ දී ප්‍රධාන ශාලාවේදී කලා උළෙලක් පවත්වන ලදී. එහිදී සිසු කුසලතා එළි දක්වෙන විශේෂාංගයක් නරඹා ආරාධිතයන් ගුරුවරුන් හා දෙමව්පියන් අමන්දානන්දයට පත්වූහ. මෙම වැඩ සටහන සඳහා සීමා සහිත සත්සර කලා ආයතනය අනුග්‍රහය දක්වන ලදී.

(01) මේ සිද්ධිය අනුව, ඉටු කෙරෙන අවශ්‍යතාවයන් වන්නේ,
(1) සන්නිවේදනය - අධ්‍යාපනය
(2) අධ්‍යාපනය - සෞඛ්‍යය
(3) විනෝදය - අධ්‍යාපනය
(4) සෞඛ්‍ය - සන්නිවේදනය

(02) පාසලේ ප්‍රධාන ශාලාව අයත් නිෂ්පාදන සාධකය වනුයේ,
(1) ප්‍රාග්ධනය
(2) භූමිය
(3) ශ්‍රමය
(4) ව්‍යවසායකත්වය

(03) සීමා සහිත සත්සර කලායතනය,
(1) රජයට අයත් භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි.
(2) සේවා නිෂ්පාදනය කරන හවුල් ව්‍යාපාරයකි.
(3) සේවා නිෂ්පාදනය කරන සංස්ථාපිත සමාගමකි.
(4) පෞද්ගලික අංශයට අයත් භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි.

(04) සුචරිත මහා විද්‍යාලයට අයත් අභ්‍යන්තර පරිසර සාධකයක් සහ බාහිර පරිසර සාධකයක් පිළිවෙළින් දක්වනුයේ,
(1) ගුරුවරු/ දෙමව්පියන්
(2) දෙමව්පියන් / සිසුන්
(3) සීමා සහිත සත්සර සමාගමට/ ගුරුවරු
(4) සිසුන් /ගුරුවරුන්

(05) සීමා සහිත සත්සර කාලායතනයට අයත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් ඇත.
(2) අඛණ්ඩ පැවැත්මක් නොමැත.
(3) වගකීම අසීමිත වේ.
(4) නීතිය ඉදිරියේ පුද්ගලයෙකු වශයෙන් පිළි ගැනේ.

(06) පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේදී භාවිතා කරනු නොලබන නිර්ණායකය තෝරන්න.
(1) ව්‍යාපාරයේ වෙළඳපොල කොටස
(2) භාවිතා කරන බලශක්ති ප්‍රභවය
(3) සේවක සංඛ්‍යාව
(4) යොදවා ඇති ප්‍රාග්ධන ප්‍රමාණය

(07) ව්‍යාපාර සංවිධාන ක්‍රමය හා ඊට ගැළපෙන නීතිමය තත්ත්වයන් නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.

| **ව්‍යාපාර සංවිධාන ක්‍රමය** | **නීතිමය තත්වයන්** |
|---|---|
| A. මලල කුමාර ස්ටෝර්ස් | 1. සමාගම් පනත |
| B. පෙරේරා සහ පුත්‍රයෝ | 2. 1972 සමූපාකාර පනත |
| C. සීමාසහිත දිමුතු සමාගම | 3. ව්‍යාපාර නාම ප්‍රඥප්තිය |
| D. හිරියාල විවිධ සේවා සමූපකාර සමිතිය | 4. වංචා වැළැක්වීමේ ආඥා පනත |

(1) A-4, B-3, C-1, D-2
(2) B-4, A-3, C-2, D-1
(3) A-2, D-3, C-4, B-1
(4) C-1, D-2, B-4, A-3

(08) මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකරමින් සමාජ සුභසාධන අරමුණු කරගත් ව්‍යාපාර සංවිධාන ද ක්‍රියාත්මක වේ. එසේ සමාජ සුභසාධනය පමණක් අරමුණු කරගත් ව්‍යාපාර සංවිධානය තෝරන්න.

(1) ශ්‍රී ලංකා වරාය අධිකාරිය (2) ලංකා පොස්පේට් සමාගම
(3) ශ්‍රී රන්තෝදය මරණාධාර සමිතිය (4) කෘෂි රක්ෂණ මණ්ඩලය

(09) ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. නීතිය ඉදිරියේ ව්‍යාපාරයේ නාමය පුද්ගලයකු ලෙස සලකනු ලබයි.
2. ඒක පුද්ගල ව්‍යාපාර සඳහා පමණක් අදාල වෙයි.
3. රාජ්‍ය දිරිගැන්වීම් ලැබීම සඳහා සුදුසුකමක් වෙයි.
4. ගිණුම් තැබීම හා විගණනය මෙමගින් අනිවාර්ය කෙරෙයි.

(10) කමල්ට ණයපතක් ඇතත් අමල්ට ඇත්තේ හරපතකි. ගනුදෙනු කිරීමේදී අමල්ට නොලැබෙන කමල්ට පමණක් හිමිවන වාසියක් වන්නේ,

1. ස්වයංක්‍රීය ටෙලර්යන්ත්‍ර මගින් ගනුදෙනු කිරීමට හැකිවීම.
2. විවිධ වට්ටම් සහන ලබාගත හැකිවීම.
3. බැංකු ගිණුමක් නොමැතිව ගනුදෙනු කළ හැකි වීම.
4. ගනුදෙනු කිරීමේදී අමතර පිරිවැයක් දැරීමට සිදු නොවීම.

(11) රුපියල් ලක්ෂ 10ක් පමණ වටිනා මෝටර් රථයක් රක්ෂණය කර ඇති විටක රුපියල් ලක්ෂ 2ක අලාභයක් සිදුවුවහොත් වන්දි වශයෙන් ලැබෙන මුදල කොපමණ විය හැකිද?

(1) රු. ලක්ෂ 7 (2) රු. ලක්ෂ 2 (3) රු. ලක්ෂ 10 (4) රු. ලක්ෂ 8

(12) බාහිර සන්නිවේදනයේදී භාවිතා වන රැස්වීම්, සාකච්ඡා සහ වැඩමුළු ආදිය (1)............................................ ලෙසත් දුරකථනය, ගුවන්විදුලිය හා අන්තර්ජාලය ආදිය (2) ..................................................................... ලෙසත් හඳුන්වයි. ඉහත 1 සහ 2 ස්ථානවලට අදාල නිවැරදි යෙදුම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර වනුයේ,

(1) වාචික සන්නිවේදන ක්‍රම, ලිඛිත සන්නිවේදන ක්‍රම (2) ලිඛිත සන්නිවේදන ක්‍රම, විද්‍යුත් සන්නිවේදන ක්‍රම
(3) වාචික සන්නිවේදන ක්‍රම, සංඥා සන්නිවේදන ක්‍රම (4) වාචික සන්නිවේද ක්‍රම, විද්‍යුත් සන්නිවේදන ක්‍රම

(13) නුවරඑළිය සිට කුරුණෑගල දක්වා ස්වාභාවික මල් ප්‍රවාහනය සඳහා සුදුසු ප්‍රවාහන ක්‍රමයක් තෝරාගැනීමේ දී (1) ......................................... සහ (2).......................................... පිළිබඳ මූලිකව අවධානය යොමු කරයි. ඉහත 1 හා 2 ස්ථානවලට අදාල නිවැරදි යෙදුම් දැක්වෙන පිළිතුර වනුයේ,

(1) පිරිවැය, ධාරිතාව (2) සුලභත්වය, වේගය (3) වේගය, ආරක්ෂාව (4)පිරිවැය, ආරක්ෂාව

(14) චෙක්පතක චුම්භක තීන්ත අක්ෂර හැඳුනුම් තීරුවේ සඳහන් අංක පිළිවෙලින් පෙලගැස්සූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

(1) චෙක්පත් අංකය, බැංකු ශාඛා අංකය, ගිණුම් අංකය, බැංකු අංකය
(2) බැංකු අංකය, බැංකු ශාඛා අංකය, චෙක්පත් අංකය, ගිණුම් අංකය
(3) ගිණුම් අංකය, බැංකු ශාඛා අංකය, බැංකු අංකය, චෙක්පත් අංකය
(4) චෙක්පත් අංකය, බැංකු අංකය, බැංකු ශාඛා අංකය, ගිණුම් අංකය

(15) ව්‍යාපාරයක අරමුණු මුදුන් පමුණුවා ගැනීමට යාමේදී ව්‍යාපාරයේ අලෙවි කටයුතු සඳහා කළමනාකරුවන් පත්කිරීම අයත් වන්නේ කුමන කළමනාකරන කාර්යකට ද?

(1) සැලසුම්කරණය (2) සංවිධානකරණය (3) මෙහෙයවීම (4) පාලනය

(16) ප්‍රාථමික ශ්‍රේණි සිසුන් සඳහා ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහිත පුවත්පතක් මුද්‍රණය කර අලෙවි කිරීම පහත කුමන සංකල්පය හා වඩාත් හොඳින් ගැලපේද යන්න තෝරන්න.

(1) ඉලක්ක වෙළෙඳසැල (2) භාණ්ඩ වෙළෙඳසැල (3) සේවා වෙළෙඳසැල (4) අවකාශ වෙළෙඳසැල

(17) ගිණුම්කරණයේ අරමුණු කීපයක් පහත දැක්වේ. මේවායින් ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ ලෙස සැලකිය හැක්කේ,

(1) ආදායම් බදු ගෙවීම.
(2) ඉදිරි කටයුතු සැලසුම් කිරීම
(3) ඇල්මක් දක්වන පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා ප්‍රයෝජනවත් තොරතුරු සැපයීම.
(4) ව්‍යාපාරික ගනුදෙනු සටහන් කිරීම තුළින් අමතක වීම් හෝ අතපසුවීම් අවම කර ගැනීම.

(18) පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණවලින් නිවැරදි ගිණුම්කරණ සමීකරණය තෝරන්න.

(1) වත්කම් + වගකීම් = හිමිකම්　　(2) වත්කම් + හිමිකම් = වගකීම්

(3) වත්කම් - වගකීම් = හිමිකම්　　(4) හිමිකම - වගකීම් = වත්කම්

(19) රු. 12,000ක කොමිස් ආදායමක් ලැබීම නිසා ව්‍යාපාරයේ,

(1) වත්කම් රු. 12 000න් වැඩි වී, හිමිකම් රු. 12 000න් වැඩි වේ.

(2) වත්කම් රු. 12 000න් අඩු වී, හිමිකම් රු. 12 000න් අඩු වේ.

(3) වගකීම් රු. 12 000න් අඩු වී, වත්කම් රු. 12 000න් වැඩි වේ.

(4) වත්කම් රු. 12 000න් වැඩි වී, වගකීම් රු. 12 000න් වැඩි වේ.

(20) පහත දැක්වෙන කරුණු අධ්‍යයනය කරන්න.

A. පාලනය කළ හැකි වීම.

B. අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් වීම.

C. අනාගත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම.

D. වර්තමාන බැඳීමක් තිබීම.

E. බේරුම් කිරීමේදී ව්‍යාපාරයේ සම්පත් වලින් කොටසක් පිටතට ගලා යාම.

ඉහත කරුණු අතුරින් වගකීමක ලක්ෂණ පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

(1) A, B හා C　　(2) B, C හා D　　(3) B, D හා E　　(4) C, D හා E

(21) ව්‍යාපාරයක් සිය රු. 25 000ක ණය හිමියෙකුගේ ණය පියවීම සඳහා රු. 22 500ක් මුදලින් ගෙවන ලදී. මෙම ගනුදෙනුව නිවැරදිව දැක්වෙන ද්විත්ව සටහන වන්නේ,

(1) ණය හිමි ගිණුම - හර 25 000, මුදල් ගිණුම - බැර 25 000

(2) ණය හිමි ගිණුම - හර 22 000, මුදල් ගිණුම - බැර 22 500

(3) ණය හිමි ගිණුම - හර 25 000, මුදල් ගිණුම - බැර 22 500, ලද වට්ටම් ගිණුම - බැර - 2 500

(4) ණයහිමි ගිණුම - හර 25 000, මුදල් ගිණුම - බැර 22,500, දුන් වට්ටම් - බැර 2 500

(22) වැරදි ද්විත්ව සටහන ඇතුලත් පිළිතුර තෝරන්න.

(1) වත්කම් ගිණුම්, වැඩිවීම - හර, අඩු වීම - බැර　　(2) වගකීම් ගිණුම්, වැඩි වීම - බැර, අඩු වීම - හර

(3) හිමිකම් ගිණුම්, වැඩි වීම - බැර, අඩු වීම - හර　　(4) වියදම් ගිණුම්, වැඩි වීම - බැර, අඩු වීම - හර

පහත තොරතුරු ඇසුරෙන් 23 හා 24 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

නිමි ඇඳුම් අලෙවි ව්‍යාපාරයක් පවත්වාගෙන යන නාලකගේ ව්‍යාපාරයේ පහත් ගනුදෙනු සිදුවිය.

A. රු. 10 000ක සේවක වැටුප් ගෙවීම.

B. රු. 150 000ක කාර්යාල උපකරණ ණයට මිල දී ගැනීම

C. රු. 20 000ක නිමි ඇඳුම් රු. 30 000ට ණයට විකිණීම.

D. රු. 18,000ක නිමි ඇඳුම් ණයට ගැනීම.

(23) ඉහත ගනුදෙනු අතුරින් පොදු ජ'නලයේ සටහන් කරන ගනුදෙනුව වන්නේ,

(1) A ය.　　(2) B ය.　　(3) C ය.　　(4) D ය.

(24) ඉහත ගනුදෙනුවලින් A හා B ගනුදෙනුවලට අදාල මූලාශ්‍ර ලේඛණ හා C හා D ගනුදෙනුවලට අදාල මූලික සටහන් පොත් පිළිවෙලින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) ගෙවීම් වවුචරය, ජ'නල් වවුචරය, විකුණුම් ජ'නලය, මුදල් පොත

(2) ගෙවීම් වවුචරය, පොදු ජ'නලය, විකුණුම් ජ'නලය, ගැණුම් ජ'නලය

(3) ගෙවීම් වවුචරය, ගැණුම් ඉන්වොයිසිය, විකුණුම් ජ'නලය, ගැණුම් ජ'නලය

(4) ගෙවීම් වවුචරය, ජ'නල් වවුචරය, විකුණුම් ජ'නලය, ගැනුම් ජ'නලය

(25) 2018 ජනවාරි 31 දිනට සුළු මුදල් භාරකරු අත ඉතිරි මුදල රු. 590කි. පෙබරවාරි මාසය සඳහා ප්‍රධාන මුදල් භාරකරු විසින් සුළු මුදල් භාරකරුට ලබාදුන් මුදල රු. 2 410කි. ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම කොපමණ ද?

(1) රු. 590කි.　　(2) රු. 1820කි.　　(3) රු. 2410කි.　　(4) රු. 3000කි.

(26) ව්‍යාපාරයක වර්ෂය අවසානයේ හිමිකම ගණනය කිරීමට පහත තොරතුරු සපයා ඇත.

ආරම්භක හිමිකම - රු. 520,000කි.
වර්ෂයේ ශුද්ධ ලාභය - රු. 38,000කි.
වර්ෂය තුල ගැනිලි - රු. 12,000කි.
යෙදූ අමතර ප්‍රාග්ධනය - රු. 40,000කි.

නිවැරදිව අවසාන හිමිකම ගණනය කර ඇති පිළිතුර තෝරන්න.

(1) රු. 548,000කි. (2) රු. 558,000කි. (3) රු. 586,000කි. (4) රු. 610,000කි.

(27) බැංකු ගිණුමේ ගනුදෙනු ඇතුලත් කිරීමට භාවිතාකරන මූලාශ්‍ර ලේඛණයක් නොවන්නේ,

(1) මුදල් තැන්පත් පත්‍රය (2) බැංකු ප්‍රකාශය (3) චෙක් පිළිපත (4) ඉන්වොයිසිය

(28) ණයහිමියෙකුට නිකුත් කළ චෙක්පතක් අගරු වීමට අදාල ද්විත්ව සටහන නිවැරදි දක්වෙන්නේ,

(1) බැංකු ගිණුම - හර, මුදල් ගිණුම - බැර
(2) බැංකු ගිණුම - හර, ණයහිමි - බැර
(3) ණයහිමි ගිණුම - හර, බැංකු ගිණුම - බැර
(4) අගරුචෙක්පත් ගිණුම - හර, බැංකු ගිණුම - බැර

(29) නදුන්ගේ ව්‍යාපාරය 1ක් රු. 100 බැගින් වූ තීන්ත පැන් 80ක් ණයට ගත් අතර එහිදී ලකුණු කල මිලෙන් 5% වෙළඳ වට්ටමක් හිමිවිය. මෙම ගනුදෙනුව නිසා,

(1) රු. 8 000ක ණයහිමි ශේෂයක් ඇතිවේ. (2) රු. 7 600ක ණය ගැති ශේෂයක් ඇති වේ.
(3) රු. 8 000 ණය ගැති ශේෂයන් ඇති වේ. (4) රු. 7 600 ණය හිමි ශේෂයන් ඇති වේ.

(30) මිහිඳුගේ ව්‍යාපාරය 2018 වර්ෂයේ දී රු. 80 000 භාණ්ඩ ණයට ගත් අතර ණයහිමියන් හට රු. 40 000ක මුදලක් ගෙවන ලදී. ඉහත ගනුදෙනු වලට අදාල මූලාශ ලේඛන පිළිවෙළින් දක්වෙන්නේ,

(1) ලදුපත හා ජ'නල වවුචරය (2) ගැනුම් ඉන්වොයිසිය හා ගෙවීම් වවුචරය
(3) ගැනුම් ඉන්වොයිසිය හා ලදුපත (4) පොදු ජ'නලය හා ගැනුම් ඉන්වොයිසිය

(31) මූලික සටහන් පොත් සම්බන්ධ පහත ප්‍රකාශය අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) පරිපාලන කටයුතු සඳහා උපකරණ ණයට ගැනීම පොදු ජ'නලයේ සටහන් කරයි.
(2) ගනුදෙනුවක් සටහන් කිරීමට විශේෂිත මූලික පොතක් නොමැති විට එය ගැනුම් ජ'නලයේ සටහන් කරයි.
(3) සුළු මුදල් භාරකරුට සෑම මසකම ස්ථාවර වටිනාකමක් ප්‍රතිපූර්ණය කරයි.
(4) ගැනුම් ඉන්වොයිසිය උපයෝගී පොතක් ලෙස භාවිතා කරයි.

(32) ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනුවක් හා එය ගිණුම්ගත කර ඇති ආකාරය පහත පරිදි වේ.

ගනුදෙනුව - රු. 15 000ක් වැය කර මෝටර් රථ අලුත්වැඩියා කිරීම.
ද්විත්ව සටහන - මෝටර් රථ අලුත්වැඩියා වියදම් ගිණුම - හර 1500/= මුදල් ගිණුම බැර 15 000
මෙම වරද හේතුවෙන්,

(1) ශේෂ පිරික්සුමේ සමානතාවයට බලපෑමක් නැත.
(2) අවිනිශ්චිත ගිණුමේ රු. 13 500ක හර ශේෂයක් ඇති වේ.
(3) අවිනිශ්චිත ගිණුමේ රු. 13 500 බැර ශේෂයක් ඇති වේ.
(4) අවිනිශ්චිත ගිණුමේ රු. 15 000 ක හර ශේෂයක් ඇති වේ.

(33) ඉහත වරද නිවැරදි කිරීමට අදාල ජර්නල සටහන වන්නේ,

(1) මෝටර් රථ අලුත්වැඩියා ගිණුම හර 15 000
අවිනිශ්චිත ගිණුම බැර 15 000

(2) අවිනිශ්චිත ගිණුම් හර 13 500
මෝටර් රථ අලුත්වැඩියා ගිණුම 13 500

(3) මෝටර් රථ අලුත්වැඩියා ගිණුම හර 13 500
අවිනිශ්චිත ගිණුම 13 500

(4) අවිනිශ්චිත හර 13 500
මුදල් 13 500

(34) බැංකු ප්‍රකාශනයේ බැර තීරුවේ දක්වෙන අයිතමයන් වන්නේ,

(1) චෙක්පත් ගාස්තු (2) ස්ථාවර නියෝග මත ගෙවීම්
(3) ණය ගැති ප්‍රේෂණ (4) අයිරා පොළී

(35) දසුන්ගේ ව්‍යාපාරයේ 2018 වර්ෂයට අදාල මාසික ගෙවල් කුලිය රු. 2 000ක් වූ අතර ඉන් රු. 16 000ක් මුදලින් ගෙවා නිවැරදිව ගිණුම් තබා ඇත. ගෙවිය යුතු ඉතිරි කුලිය ගැලපීමට අදාල නිවැරදි ජ'නල සටහන වන්නේ,

| | | | | | |
|---|---|---|---|---|---|
| (1) | ගෙවල් කුලී ගිණුම හර | 8 000 | (2) | ගෙවිය යුතු ගෙවල් කුලී හර | 8 000 |
| | මුදල් ගිණුම බැර | 8 000 | | මුදල් | 8 000 |
| (3) | ගෙවල් කුලී හර | 8 000 | (4) | ගෙවල් කුලී ගිණුම හර | 8 000 |
| | ගෙවිය යුතු ගෙවල් කුලී බැර | 8 000 | | අවිනිශ්චිත ගිණුම බැර | 8 000 |

● ඉසුරු උදානගේ ව්‍යාපාරයේ 2018/12/31 දිනට ශේෂ පිරික්සුම පහත පරිදි වේ. ඒ ඇසුරින් 36 - 40 දක්වා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| ආරම්භක තොගය | 40 000 | |
| ගැනුම් | 80 000 | |
| විකුණුම් | | 170 000 |
| දුන් වට්ටම් | 5 000 | |
| ලද වට්ටම් | | 7 000 |
| 10% බැංකු ණය | | 100 000 |
| මෝටර් රථ | 500 000 | |
| ගොඩනැගිලි | 300 000 | |
| විදුලිය ගාස්තු | 5 000 | |
| වැටුප් වියදම් | 15 000 | |
| ණය හිමියෝ | | 15 000 |
| ප්‍රාග්ධනය | | 653 000 |
| | 945 000 | 945 000 |

<u>අතිරේක තොරතුරු</u>

- 2018/12/31 දිනට තොගය 12 000කි.
- 2018/12/31 දිනට ගෙවිය යුතු වැටුප් 5 000කි.
- බැංකු ණය වර්ෂය පුරාම පැවතුණි.

(36) මෙම ව්‍යාපාරයේ 2018/12/31න් අවසන් වර්ෂය සඳහා දළ ලාභය වනුයේ,
(1) 120 000කි. (2) 62 000කි. (3) 50 000කි. (4) 29 000කි.

(37) 2018/12/31 න් අවසන් වර්ෂය සඳහා මෙම ව්‍යාපාරයේ ලාභ ලාභ ගිණුමේ හඳුනාගත යුතු වියදම්වල අගය වනුයේ,
(1) 108 000කි. (2) 62 000කි. (3) 40 000කි. (4) 29 000කි.

(38) 2018/12/31 න් අවසන් වර්ෂය සඳහා ඉසුරු උදානගේ ව්‍යාපාරයේ ශුද්ධ ලාභය වනුයේ,
(1) 120 000කි. (2) 108 000කි. (3) 62 000කි. (4) 29 000කි.

(39) ඉසුරු උදානයේ ව්‍යාපාරයේ 2018/12/31 දිනට හිමිකමේ අගය වනුයේ,
(1) 653 000කි. (2) 682 000කි. (3) 631 000කි. (4) 277 000කි.

(40) 2018/12/31 දිනට මෙම ව්‍යාපාරයේ ජංගම වගකීම්වල වටිනාකම වන්නේ,
(1) 100 000කි. (2) 20 000කි. (3) 15 000කි. (4) 30 000කි.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

60 S II

## දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019
## Second Term Test - Grade 11 - 2019

නම/විභාග අංකය : .............................. ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය- II කාලය : පැ. 02යි.

වැදගත් :

✳ පළමු ප්‍රශ්නය ඇතුළුව , I කොටසින් ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න දෙකක් ද, බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) පහත සිද්ධිය ඇසුරෙන් (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුර සපයන්න.

සුමල් ''මල් ෆැෂන්'' නමින් නිමි ඇඳුම් විකිණීමේ ව්‍යාපාරයක් ප්‍රධාන නගරයක මධ්‍යයේ ආරම්භ කරන ලදී. අලෙවිය සඳහා අවශ්‍ය විවිධ මෝස්තරවලින් යුත් ඇඳුම් වර්ග සි/ස ඇල්ෆයින් ගාමන්ට්ස් වෙතින් විශේෂ වට්ටම් සහිතව ලබා ගනියි. මේ සඳහා 2019/01/01 දින ඔහුගේ රු. 600 000 වටිනා ලොරි රථය යොදවන ලදී. ව්‍යාපාරයේ කටයුතු සඳහා අලෙවිකරණ පාඨමාලාවක් හදාරා ඇති එක් සේවකයෙක් බඳවා ගන්නා ලදී. ඇඳුම් විකුණන විට විශේෂ වට්ටම් පහසුකම් ලබා දෙන අතර ආයතනයේ නම මුද්‍රණය කළ ඇසුරුමක් ලබා දෙයි. ඉදිරි වර්ෂයේ මහන මැෂින් 05ක් මිලදී ගෙන ඇඳුම් මැසීම ආරම්භ කිරීමට තීරණය කරන ලදී.

2019 ජනවාරි මාසයට අදාල සුමල්ගේ ව්‍යාපාරයේ මුදල් පොත පහත දැක්වේ.

මුදල් පොත

| දිනය | ල.අ. | විස්තරය | ස.පි. | වටිනාකම | දිනය | ව.අ. | විස්තරය | ස.පි. | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1/1 | 01 | ප්‍රාග්ධනය | | 300 000 | 1/3 | | ගැණුම් | 01 | 75 000 |
| 1/2 | 02 | බැංකු ණය | | 500 000 | 1/4 | | උපකරණ | 02 | 25 000 |
| 1/27 | 03 | විකුණුම් | | 150 000 | 1/8 | | ප්‍රචාරණය | 03 | 10 000 |
| 1/28 | 04 | ණයගැති | | 20 000 | 1/20 | | දුරකථන | 04 | 2 000 |
| | | | | | 1/21 | | ගැනිලි | 05 | 5 000 |
| | | | | | 1/25 | | ගොඩනැගිලි කුලී | 06 | 25 000 |
| | | | | | 1/27 | | වැටුප් | 07 | 25 000 |
| | | | | | 1/31 | | ශේෂය ප/ගෙ | | 803 000 |
| | | | | 970 000 | | | | | 970 000 |
| 2/1 | | ශේෂය ඉ/ගේ | | 803 000 | | | | | |

ජනවාරි මාසයට අදාල තොරතුරු පහත දැක්වේ.

- ජනවාරි මාසයේ උපචිත ණයපොලී 500
- 2019/01/03 නිමි ඇඳුම් ණයට ගැනුම රු. 25 000
- ලොරි රථය වාර්ෂික 10% ක්ෂය කළ යුතුය.
- 2019/01/27 නිමි ඇඳුම් ණයට විකුණුම් රු. 50 000
- ඉතිරි තොග කිසිවක් නොමැත.

(i) පහත ව්‍යාපාරවල නිෂ්පාදන කරනු ලබන නිෂ්පාදිතවල ස්වභාවය අනුව කුමන ව්‍යාපාර වර්ගවලට අයත් වේද?

(අ) (a) මල් පැෂන්

(b) ඇල්ෆයින් ගාමන්ට්ස්

(ආ) සීමා සහිත ඇලෆයින් ගාමන්ට්ස් ආයතනය අයත් ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

(ii) (අ) සුමල් ව්‍යාපාරය සතු ශක්තීන් එකක් සහ අවස්ථා එකක් නම් කරන්න.

(ආ) සුමල්ගේ ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතු ද? ඒ සඳහා බලපාන නීතිමය තත්ත්වය පැහැදිලි කරන්න.

(iii) (අ) සුමල්ගේ ව්‍යාපාර සංවිධාන වර්ගයේ සහ සීමාසහිත ඇල්ෆයින් ගාමන්ට්ස් ව්‍යාපාර සංවිධාන වර්ගයේ දක්නට ලැබෙන වාසි එක බැගින් ඉදිරිපත් කරන්න.

(ආ) සුමල් විසින් කරනු ලබන වෙළෙඳාම සහ ඇල්ෆයින් ගාමන්ට් කරනු ලබන වෙළෙඳාම කුමන වෙළඳාම් ප්‍රභේදයන්ට අයත් වේද?

(iv) ඉහත සිද්ධියේ දැක්වෙන පහත සඳහන් කළමනාකරණ සහ අලෙවි කළමනාකරණ විචල්‍යන්ට උදාහරණ දක්වන්න.

(a) සැලසුම්කරණය (b) සංවිධානකරණය (c) නිෂ්පාදිතය (d) ප්‍රවර්ධනය

(v) 2019/01/02 දිනට සුමල්ගේ ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය දක්වන්න.

(vi) මෙම ව්‍යාපාරයේ පවත්වාගත යුතු මූලික පොත් දෙකක් නම් කරන්න.

(vii) ණයට ගැනුම් ගිණුම් ගත කිරීමට අදාළ ද්විත්ව සටහන අගයන් සහිතව ලියා දක්වන්න.

(viii) මෙම ව්‍යාපාරයේ ලෙජරය තුළ දැකිය හැකි ගිණුම් වර්ග හතරක් නම් කර ඒවාට උදාහරණයක් බැගින් ලියන්න.

(ix) ව්‍යාපාරයේ හිමිකම වෙනස් වන ගනුදෙනු දෙකක් අගයන් සහිතව ලියා දක්වන්න.

(x) 2019/01/31 ශුද්ධ ලාභය ගණනය කරන්න. (ලකුණු 2 x 10 = 20)

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

- ප්‍රශ්න දෙකකට පිළිතුර සපයන්න.

(02) (i) (අ) ව්‍යාපාර පරිසරය යනු කුමක් ද?

(ආ) ව්‍යාපාර පරිසරය වර්ග කර දක්වන්න.

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) භාණ්ඩ අතිරික්තයන් බිහිවීම බාටර් ක්‍රමයට හේතු විය.

(ආ) කාර්මීකරණයේ ප්‍රතිඵලයක් ලෙස අවකාශ වෙළඳසැල් ඇති විය.

(ඉ) සේවක සුභසාධනය ව්‍යාපාර අරමුණු ඉටුකරගැනීමේ දී හමුවන ඉලක්කයකි.

(ඊ) වුවමනා පුද්ගලයාගේ ආර්ථික මට්ටම මත පමණක් වෙනස් වේ.

(iii) විශ්ව විද්‍යාල අධ්‍යාපන අවසන් කල ගුණසේන ව්‍යාපාර උපදේශන සේවා සැපයීමේ ආයතනයන් ආරම්භ කරන ලදී. එමගින් ප්‍රදේශයේ කුඩා ව්‍යාපාරිකයින් දිරිගැන්වීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම ඔහුගේ අපේක්ෂාවයි. ව්‍යාපාර කටයුතු පහසු කර ගැනීම සඳහා ප්‍රදේශයේ උසස් පෙළ සමත් තරුණයන් කිහිපදෙනකු ද බඳවා ගන්නා ලදී.

(අ) ඉහත ව්‍යාපාර ආයතනය පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශව දෙකක් සඳහන් කරන්න.

(ආ) ඉහත (අ) හි සඳහන් කල එක් පාර්ශවයක් ව්‍යාපාරය තුළින් ඉටු කරගැනීමට අපේක්ෂා කරනු ලබන අරමුණු 2ක් සඳහන් කරන්න.

(iv) 2019 අයවැය යෝජනා පසුගියදා ඉදිරිපත් කරන ලද එහිදී මෝටර්රථ වාහන සඳහා නව ''කාබන් බද්දක්'' පැනවීමට රජය තීරණය කරන ලදී.

(අ) ඉහත සිද්ධියට අදාළ වන පරිසර සාධකයක් ලියන්න.

(ආ) කාබන් බද්ද පැනවීම තුළින් රජය අපේක්ෂා කරන අරමුණක් ලියන්න.

(ලකුණු 2 x 4 = 8)

(03) (i) (අ) ඒක පුද්ගල ව්‍යාපාරයක් යනු කුමක් ද?

(ආ) ඒක පුද්ගල ව්‍යාපාරයක ලක්ෂණ දෙකක් ලියන්න.

(ii) වෛද්‍යවරුන් කිහිපදෙනකු එක්ව ඇරඹීමට යන ව්‍යාපාර සංවිධානයක සඳහා පහත සඳහන් ගැටළුවලට ඔබෙන් පිළිතුරු අපේක්ෂා කරයි.

(අ) ඔවුන් සඳහා ඇරඹීමට සුදුසු, වඩාත් යෝග්‍ය ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද?

(ආ) ඔවුන් අරම්භක ප්‍රාග්ධනය ලෙස රු. 50 000ක් යොදවයි නම්, එම මුදලේ ආරක්ෂාව සම්බන්ධයෙන් ගත හැකි පියවර කුමක් ද?

(iii) පහත සඳහන් ප්‍රකාශවල සත්‍ය, අසත්‍යතාව සඳහන් කරන්න.

(අ) ව්‍යාපාරයේ සෑම නීතිමය කටයුත්තක්ම තම නමින් සිදුකල යුතු වීම ඒක පුද්ගල ව්‍යාපාර ක්‍රමයේ වාසියකි.

(ආ) හවුල් ව්‍යාපාරයක සාමාජික සංඛ්‍යාව පිළිබඳ හවුල් ආඥාපනතෙහි සඳහන් නොවේ.

(ඉ) සමූපකාර සමිතියක අවම සාමාජික සංඛ්‍යාව 10කි.

(ඊ) රාජ්‍ය දෙපාර්තමේන්තු සඳහා නීතිමය පුද්ගලභාවයන් නැත.

(iv) කමල් තම සේවා ස්ථානය අසල ඇති සුපිරි වෙළෙඳසැලෙන් රාත්‍රී ආහාරය සඳහා පාන් රාත්තලක් සහ බිත්තර කිහිපයක් මිල දී ගත් අතර තම ණය කාඩ්පත ඉදිරිපත් කර මුදල් ගෙවන ලදී.

(අ) කමල් භාණ්ඩ මිලදී ගැනීම සඳහා තෝරාගෙන ඇත්තේ කුමන ස්වරූපයේ වෙළඳ ව්‍යාපාරයක් ද?

(ආ) ණය කාඩ්පත භාවිතයෙන් කමල්ට ලැබිය හැකි ප්‍රතිලාභ දෙකක් ලියන්න.

(ලකුණු 2 x 4 = 8)

(04) (i) (අ) බලපත්‍රලාභී වාණිජ බැංකු යනු මොනවා ද?

(ආ) බලපත්‍රලාභී වාණිජ බැංකු ව්‍යාපාරිකයින්ට සපයනු ලබන සේවාවන් දෙකක් ලියන්න.

(ii) පාසල් අධ්‍යාපනය අවසන් කළ උර්සුලාහට සම්මුඛ පරීක්ෂණයක් සඳහා අන්තර්ජාතික සමාගමකින් දුරකථනයෙන් කැඳවා තිබිණි. සම්මුඛ පරීක්ෂණය තම නිවසේ සිටම අන්තර්ජාලය හරහා පැවති අතර සහතිකපත් විද්‍යුත් තැපැලෙන් යවන ලදී. දින කිහිපයනට පසුව එම සමාගමේ ශ්‍රී ලංකා ශාඛාව විසින් උර්සුලා තෝරා ගෙන ඇති බව දන්වා ලිපියක් නිවසට එවන ලදී.

(අ) ඉහත සිද්ධියේ සඳහන් වන සන්නිවේදන මාධ්‍ය නම්කර අන්තර්ජාලය හරහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සඳහා සුදුසු සන්නිවේදන ක්‍රමයක් නම් කරන්න.

(ආ) ඉහත භාවිත කර ඇති සන්නිවේදන මාධ්‍ය තෝරාගැනීමේදී සමාගම විසින් සලකා බලන ලදැයි සිතන කරුණු දෙකක් ලියන්න.

(iii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) පාසල් ආපනශාලාවෙන් ආහාරපාන මිලදී ගැනීම සිල්ලර වෙළඳාමට අදාල ගනුදෙනුවකි.

(ආ) අධික ලාභයක් අපේක්ෂා කරන බැවින් තොග මිල සාපේක්ෂව ඉතා ඉහල අගයක් ගනී.

(ඉ) ජ්‍යෙෂ්ඨ පුරවැසි ගිණුම ජංගම ගිණුම් සඳහා නිදසුනකි.

(ඊ) පියෙකුට තම දරුවන් රක්ෂණය කිරීමට නීත්‍යානුකූල අයිතියක් නැත.

(iv) ඔබේ පාසලේ අඩු ආදායම් ලාභී දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා සංවිධානය කරනු ලබන 'පාසල් පොල' මෙවරටත් දෙසැම්බර් මස පැවැත්වෙන්නේ යැයි සිතන්න. එහි සියලු කටයුතු සැලසුම් කිරීමට ඔබට පවරා ඇතැයි සිතා එහිදී ඔබ ගනු ලබන තීරණ දෙකක් ලියා දක්වන්න. (2 x 4 = 8)

## II කොටස - ගිණුම්කරණය

- ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

(05) (i) (අ) ගිණුම්කරණ තොරතුරු පරිශීලනය කරනු ලබන පාර්ශව දෙකක් සඳහන් කරන්න.

(ආ) ගිණුම්කරණ සමීකරණයේ වත්කම්වලට පමණක් බලපාන (වත්කම් පමණක් වෙනස් වන) ගනුදෙනුවක් ලියන්න. (ලකුණ 02යි)

(ii) පහත දක්වෙන්නේ සිල්ලර වෙළඳ ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු දෙකකි.

(අ) රු. 150 000ක බැංකු ණයක් ලබා ගැනීම. (ආ) රු. 6 000ක භාණ්ඩ නිමල්ට ණයට විකිණීම.

ඉහත එක් එක් ගනුදෙනුවේ ද්විත්ව සටහන සඳහන් කරන්න. (ලකුණ 02යි)

(iii) පරිගණක අලෙවිකරණ තරිඳුගේ ව්‍යාපාරයේ 2019 මැයි 31 දිනෙන් අවසන් වූ මාසයේ සිදු වූ ගනුදෙනු කීපයක් ගිණුම්කරණ සමීකරණය තුළ පහත පරිදි දක්වා ඇත.

| | වත්කම් = හිමිකම් + වගකීම් | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | කාර්. උප | තොගය | ණයගැති | මුදල් | හිමිකම් | බැංකු ණය | ණය හිමියෝ |
| 2019/5/1 දිනට ශේෂය | 200 000 | 20 000 | 40 000 | 28 000 | ? | 150 000 | 31 000 |
| (1) | | + 12 000 | | | | | + 12 000 |
| (2) | | | | - 9 000 | - 1 000 | - 8 000 | |
| (3) | | | - 10 000 | + 8 000 | - 2 000 | | |
| (4) | | - 5 000 | | + 7 500 | + 2 500 | | |

(අ) ඉහත මාසය තුළ සිදු වී ඇති ගනුදෙනු එකින් එක අගයන් සහිතව සඳහන් කරන්න.

(ආ) 1. ආරම්භක දිනට (2019.05.01) හිමිකම ගණනය කරන්න.

2. ව්‍යාපාරයේ 2018.05.31 දිනට, A - ජංගම වත්කම්වල අගය B - ජංගම නොවන වගකීම්වල අගය C - හිමිකමේ අගය ගණනය කරන්න. (ලකුණු 04)

(iv) 2019 මැයි මාසයේ කුමාරගේ සිල්ලර වෙළඳ ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු කීපයක් පහත දැක්වේ.

| දිනය | ගනුදෙනුව | මූලාශ්‍ර ලේඛණය |
|---|---|---|
| 05/03 | එකක් රු. 150 බැගින් බිස්කට් පැකට් 20ක් රුවන්ගෙන් ණයට ගැනීම. | ඉන්. අංකය 512 |
| 05/04 | එකක් රු. 35 බැගින් අභ්‍යාස පොත් 50ක් අත්පිට මිලදී ගැනීම. | ලදුපත් අංක 30 |
| 05/12 | එකක් රු. 20 000 බැගින් භාණ්ඩ ඇසිරීමේ රාක්ක 2ක් දම්රෝ ආයතනයෙන් ණයට ගැනීම. | ජර්නල් වවුචර් අංක 310 |
| 05/15 | එකක් රු. 70 බැගින් සහල් කිලෝ 50ක් අරලිය ව්‍යාපාරයේ ණයට ගැනීම. | ඉන්. අංකය 818 |
| 05/21 | එකක් රු. 95 බැගින් සීනි කිලෝ 2ක් සහන්ට ණයට විකිණීම. | ඉන්. අංකය 915 |

අවශ්‍ය වන්නේ, (අ) 2019 මැයි මාසය සඳහා කුමාරගේ ව්‍යාපාරයේ ගැනුම් ජ'නලය පිළියෙළ කිරීම.

(ආ) 2019.05.31 දිනට ගැනුම් ජර්නලයේ ගනුදෙනු ලෙජර් ගිනුම්වලට පිටපත් කිරීම. (ලකුණු 04)

(මුළු ලකුණු 12)

(06) (i) (අ) පරිගණක ආශ්‍රිත ගිණුම්කරණයේ වාසියක් සඳහන් කරන්න.

(ආ) ශේෂ පිරික්සුම යනු කුමක් ද? (ලකුණු 02)

(ii) 2019/5/31 දිනට සුළු මුදල් භාරකරු අත ඉතිරි මුදල රු. 1 500කි. මැයි මාසයේ සුළු වියදම් විශ්ලේෂණය තීරුවල ශේෂ පහත දැක්වේ.

සංග්‍රහ වියදම් 1 800 ලිපි ද්‍රව්‍ය 2 700 ගමන් වියදම් 2 400 විවිධ වියදම් 1 600

(අ) 2019 මැයි මාසයේ සුළු මුදල් වියදම කොපමණ ද?

(ආ) 2019 ජුනි මාසයේ සිට සුළු මුදල් අග්‍රිමය රු. 5 000න් වැඩි කිරීමට තීරණය කර ඇත්නම් 2019/06/01 දිනට ප්‍රතිපූර්ණය කළ යුතු මුදල කොපමණද?

(iii) (අ) 1. බැංකු ප්‍රකාශණය යනු කුමක් ද? (ලකුණු 02)

2. සංශෝධිත බැංකු ගිණුම පිළියෙළ කිරීමේදී සලකා බැලිය යුතු අයිතම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ආ) සමන්තගේ ව්‍යාපාරයේ 2019/5/31 බැංකු ගිණුමේ දැක්වුණු ශේෂය රු. 24 500කි. එදිනට බැංකුව විසින් එවා ඇති බැංකු ප්‍රකාශණයේ ශේෂය සමග එය එකග නොවීය.

වෙනසට පහත හේතු බලපා ඇති බව අනාවරණය විය.

(1) ඍජු ණයගැති ප්‍රේශණ රු. 2 000කි.

(2) බැංකුව අය කළ බැංකු ගාස්තුව රු. 750කි.

(3) තැන්පත් කළ නමුත් නිශ්කාශණය නොවූ චෙක්පත් රු. 3 000කි.

(4) නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 4 000කි.

අවශ්‍ය වන්නේ,

(1) සංශෝධිත බැංකු ගිණුම පිළියෙළ කරන්න.

(2) බැංකු සැසඳුම් විස්තරය පිළියෙළ කරන්න. (ලකුණු 02)

(iv) අවිශ්කගේ ව්‍යාපාරයේ 2019/05/31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම සමාන නොවීය. වෙනස අවිනිශ්චිත ගිණුමට ඇතුළත් කරන ලදී.

පසුව කළ පරීක්ෂාවේ දී පහත දෝෂ අනාවරණය වී ඇත.

(1) ලද රු. 1 500ක කොමිස්, ගෙවූ කොමිස් ලෙස කොමිස් වියදම් ගිණුමේ සටහන් වීම.

(2) රු. 2 000ක වැටුප් ගෙවීම සම්පූර්ණයෙන් ම ගිණුම් ගත නොවීම.

(3) රු. 4 000ක විදුලි වියදම් ගිණුම ශේෂ පිරික්සුමට ඇතුලත් නොකිරීම.

(4) රු. 4 000ක ගැනුම් ඉන්වොයිසියක් පොත්වලින් සම්පූර්ණයෙන් ම මග හැරීම.

අවශ්‍ය වන්නේ,

1. ඉහත වැරදි නිවැරදි කිරිමේ ජ'නල් සටහන් ඉදිරිපත් කිරීම.

2. අවිනිශ්චිත ගිණුම පිළියෙල කිරීම.

(ලකුණු 04)

(මුළු ලකුණු 12)

(07) (i) (අ) ව්‍යාපාරයක් විසින් වෙළඳ ගිණුම පිළියෙල කිරීමේ අරමුණ කුමක් ද?

(ආ) ණය ගැතියන්ගෙන් රු. 3 000ක් බොල්ණය ලෙස කපා හැරීම ගිණුම් ගත කිරීමට අදාල ජ'නල සටහන ලියා දක්වන්න.

(ii) (අ) වත්කමක් දැකිය හැකි ලක්ෂණ 2ක් ලියන්න.

(ආ) මූල්‍ය තත්ව ප්‍රකාශණය පිළියෙළ කිරීමට යොදා ගන්නා මූලිකාංග දෙකක් දක්වන්න. (ලකුණු 02)

(iii) එකමුතු ව්‍යාපාරයේ 2018/12/31 දිනට පිළියෙළ කල ශේෂ පිරික්සුම පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| තොගය 2018/01/01 | 16 000 | |
| ගැනුම් | 120 000 | |
| විකුණුම් | | 220 000 |
| ප්‍රාග්ධනය | | 212 000 |
| ණය ගැතියෝ | 40 000 | |
| ණය හිමියෝ | | 27 000 |
| 10% බැංකු ණය | | 50 000 |
| ඉඩම් පිරිවැය | 100 000 | |
| මෝටර් රථ පිරිවැය | 150 000 | |
| ප්‍රචාරණය | 20 000 | |
| වැටුප් | 14 000 | |
| ගොඩනැගිලි කුලී | 9 000 | |
| දුන් වට්ටම් | 4 000 | |
| ලද වට්ටම් | | 1 000 |
| අතැති මුදල් | 35 000 | |
| ගෙවූ ණය පොලී | 2 000 | |
| | 510 000 | 510 000 |

**අතිරේක තොරතුරු**

2018/12/31 දිනට තොගය 26 000කි.

ණයගැතියන්ගෙන් රු. 2 000ක් බොල්ණය ලෙස කපා හල යුතුය.

මෝටර් රථ වාර්ෂිකව 10% බැගින් ක්ෂය කළ යුතුය.

**අවශ්‍ය වන්නේ,**

(අ) 2018/12/31 අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ලකුණු 04)

(ආ) 2018/12/31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය (ලකුණු 04)

(මුළු ලකුණු 12)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

Answer

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

60 S I,II

## දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019
## Second Term Test - Grade 11 - 2019

### ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 2 | 21. | 3 | 31. | 1 |
| 02. | 1 | 12. | 4 | 22. | 4 | 32. | 2 |
| 03. | 3 | 13. | 3 | 23. | 2 | 33. | 3 |
| 04. | 1 | 14. | 4 | 24. | 4 | 34. | 3 |
| 05. | 4 | 15. | 2 | 25. | 4 | 35. | 3 |
| 06. | 2 | 16. | 1 | 26. | 3 | 36. | 2 |
| 07. | 4 | 17. | 3 | 27. | 4 | 37. | 3 |
| 08. | 3 | 18. | 3 | 28. | 2 | 38. | 4 |
| 09. | 3 | 19. | 1 | 29. | 4 | 39. | 2 |
| 10. | 3 | 20. | 3 | 30. | 2 | 40. | 4 |

## II පත්‍රය

(01) (i) (අ) a. සේවා නිෂ්පාදන ව්‍යාපාර (ලකුණු 1/2 x 2 = 01)
b. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර
(ආ) a. සංස්ථාපිත සමාගම් (ලකුණු 01)

(ii) (අ) ශක්තීන්
ප්‍රාග්ධනය තිබීම.
පුහුණු සේවකයෙක් සිටීම.
අවස්ථාව
ප්‍රධාන නගරයක මධ්‍යයේ පිහිටා තිබීම. (ලකුණු 1/2 x 2 = 01)

(iii) (අ) ලියා පදිංචි කළ යුතුය / ඔව්
අදාල පළාත් සභාවේ ව්‍යාපාර නාම ප්‍රඥාප්තිය යටතේ (ලකුණු 1/2 x 2 = 01)
(ආ) සුමල් ව්‍යාපාරයේ
- ස්වාධීන තීරණ ගැනීම
- ලාභය තනිව භුක්ති විඳීම
- පහසුවෙන් ආරම්භ කළ හැකියාව
- ව්‍යාපාර තොරතුරුවල රහස්‍යභාවය
ඇල්ෆයින් ගාමන්ට්ස්
- වැඩි ප්‍රාග්ධනයක් රැස්කරගත හැකි බව
- නෛතික පුද්ගලභාවයක් හිමිවීම
- අඛණ්ඩ පැවැත්මක් තිබීම
- වගකීම සීමා සහිත වීම
- අධ්‍යක්ෂක මණ්ඩලයක මගින් කළමනාකරණය කිරීම (ලකුණු 1/2 x 2 = 01)
(ආ) සුමල්ගේ ව්‍යාපාරය - සිල්ලර වෙළඳාම
ඇල්ෆයින් ගාමන්ට්ස් - තොග වෙළඳාම (ලකුණු 1/2 x 2 = 01)

(iv) (a) ඉදිරි වර්ෂයේ ඇඳුම් මැසීම ආරම්භ කිරීමට තීරණය කිරීම.
(b) සේවකයෙක් බඳවා ගැනීම.
(c) විවිධ මෝස්තරවලින් යුත් ඇඳුම් විකිණීම/ ඇසුරුමක් ලබාදීම.
(d) වට්ටම් ලබා දීම/නම මුද්‍රණය කළ ඇසුරුමක් ලබා දීම.

(v)

| | වත්කම් | | | ප්‍රාග්ධන | | + | වගකීම් |
|---|---|---|---|---|---|---|---|
| (1/2) | මුදල් | 300 000 | = | මුදල් | 300 000 | + | |
| (1/2) | ලොරි රථය | 600 000 | = | ලොරිය | 600 000 | + | |
| (1/2) | මුදල් | 500 000 | = | | | + | 500 000 |
| | | 1 400 000 | = | 900 000 | | + | 500 000 (බැංකු ණය) |
| | | හෝ | | | | | |
| | | 1 400 000 | = | මුදල් | 900 000 | + | 500 000 (බැංකු ණය) |

(ලකුණු 02)

(vi) මුදල් පොත
ගැනුම් ජ'නලය
විකුණුම් ජ'නලය
පොදු ජ'නලය (ලකුණු 1/2 x 2 = 4)

(vii) ගැනුම් ගිණුම - හර 25 000
ණයහිමි ගිණුම - බැර 25 000 (ලකුණු 02)

(viii) වත්කම් - මුදල් පොත, ණයගැති ගිණුම, මෝටර් රථ (ලොරි රථ ගිණුම) උපකරණ ගිණුම
වගකීම් - බැංකු ණය, ණය හිමි ගිණුම
හිමිකම් - ප්‍රාග්ධන ගිණුම්, ගැනිලි
ආදායම් - විකුණුම් ගිණුම
වියදම් - ගැනුම් ගිණුම, ප්‍රචාරණය, දුරකථන, වැටුප (ලකුණු 02)

(ix) 1. රු. 5 000ක මුදල් ගැනිලි සිදු කිරීම.
2. රු. 300 000ක මුදලක් ප්‍රාග්ධනය ලෙස යෙදීම.
3. රු. 600 000ක ලොරි රථය යෙදවීම. (ලකුණු 1 x 2 = 2)

(x) විකුණුම් (50 000 + 150 000) = 200 000
විකුණුම් පිරිවැය (75 000 + 25 000) = 100 000
දළ ලාභය = 100 000

**වියදම්**

| | | | |
|---|---|---|---|
| ප්‍රචාරණ | 10 000 | (1/2) | |
| දුරකථන | 2 000 | | |
| ගොඩ. කුලිය | 25 000 | | |
| වැටුප් | 25 000 | | |
| ණය පොළී | 500 | (1/2) | |
| මෝ. රක්ෂණය | 5 000 | | (67 500) |
| ශුද්ධ ලාභය | | | 32 500 |

(ලකුණු 02)

## I කොටස

(02) (i) (අ) ව්‍යාපාරයක පැවැත්මට සෘජුව හා වක්‍රව බලපෑම් ඇති කරන්නා වූ විවිධ සාධක ක්‍රියාත්මක වන වටපිටාවයි. (ලකුණු 01)

(ආ)

ව්‍යාපාර පරිසරය
- අභ්‍යන්තර
- බාහිර

(ලකුණු 01)

(ii) (අ) සත්‍ය (ආ) අසත්‍ය (ඉ) සත්‍ය (ඊ) අසත්‍ය (1/2 x 4 = 2)

(iii) (අ) සේවකයෝ, ගනුදෙනුකරුවෝ, තරඟකරුවෝ, ප්‍රජාව, රජය

(ආ) සේවකයෝ - සාධාරණ වැටුප් ලබාගැනීම, රැකියා සුරක්ෂිත බව (ලකුණු 01)
ගනුදෙනුකරුවෝ - සේවා සාධාරණ මිලට ලබාගැනීම.
- ගුණාත්මක උපදේශන සේවාවන් ලබාදීම. (ගැළපෙන පිළිතුරකට) (ලකුණු 01)

(iv) (අ) දේශපාලන පරිසරය

(ආ) 1. පරිසර දූෂණය අවම කිරීම. (ලකුණු 01)
2. රාජ්‍ය බදු ආදායම වැඩිකර ගැනීම. (වෙනත් ගැළපෙන පිළිතුරකට) (ලකුණු 01)

(03) (i) (අ) හිමිකාරිත්වය එක් පුද්ගලයකු සතු වන ව්‍යාපාර (ලකුණු 01)

(ආ) 1. ප්‍රාග්ධනය තනි පුද්ගලයකු විසින් යෙදවීම.
2. ලාභ/අලාභ තනිව භුක්ති විඳීම.
3. වගකීම අසීමිත වීම.
4. නීතිමය පුද්ගලභාවයන් නොමැති වීම.
5. අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.
6. ලියා පදිංචිය අනිවාර්ය නොවීම. (ලකුණු 01)

(ii) (අ) හවුල් ව්‍යාපාර (ලකුණු 01)
(ආ) හවුල් ව්‍යාපාරය ලිඛිත ගිවිසුමක් යටතේ පවත්වාගෙන යාම. (ලකුණු 01)

(iii) (අ) අසත්‍ය (ආ) සත්‍ය (ඉ) සත්‍ය (ඊ) සත්‍ය (ලකුණු 1/2 x 4 = 02)

(iv) (අ) ස්ථාවර මහා පරිමාණ සිල්ලර වෙළඳසැල් (ලකුණු 01)
(ආ) 1. මුදල් අත නැතත් භාණ්ඩ හා සේවා ලබාගැනීමේ හැකියාව
2. ජාත්‍යන්තර මිලදී ගැනීම් සඳහා භාවිතා කල හැකි වීම.
3. ATM යන්ත්‍ර මගින් ද මුදල් ලබා ගත හැකි වීම.
4. වට්ටම් හා ප්‍රසාද ලකුණු හිමි වීම. (ලකුණු 01)

(ලකුණු 2 x 4 = 8)

(04) (i) (අ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ කටයුතු කරන වාණිජ බැංකු හෝ ජංගම ගිණුම් පවත්වාගෙන යාමට බලය පවරා ඇති වාණිජ බැංකු (ලකුණු 01)

(ආ) 1. තැන්පතු ආශ්‍රිත සේවා
2. ණය ආශ්‍රිත සේවා
3. විද්‍යුත් මුදල් ආශ්‍රිත සේවා (ලකුණු 01)

(ii) (අ) විද්‍යුත් (ල. 1/2) Viber, Whatsapp, Skype, Imo (ගැළපෙන පිළිතුරකට) (ල. 1/2) (ලකුණු 01)
(ආ) වේගවත් බව, පිරිවැය, භාවිතා කිරීමේ පහසුව (ලකුණු 01)

(iii) (අ) සත්‍ය (ආ) අසත්‍ය (ඉ) අසත්‍ය (ඊ) සත්‍ය (1/2 x 4 = 2)

(iv) 1. නිශ්චිත දිනය තීරණය කිරීම.
2. ස්ථානය හා අලෙවි කටයුතු පන්ති මට්ටමෙන් සිදු කරන ආකාරය තීරණය කිරීම.
3. අවශ්‍ය ලී බඩු, තරාදි, භාජන යන වෙනත් දෑ සහ සිසුන් කුටි සඳහා අවශ්‍ය වන ප්‍රමාණය තීරණය කිරීම.
4. ඉහත අවශ්‍ය සම්පත් ලබාගන්නා ආකාරය තීරණය කිරීම. (ලකුණු 02)

(ලකුණු 2 x 4 = 8)

## II කොටස

(05) (i) (අ) අයිතිකරුවන්, කළමනාකරුවන්, ණය හිමියන්, සේවකයන්, රජය (ලකුණු 1/2 x 2 = 1)

(ආ) - රු. 5 000ක් ණයගැතියන්ගෙන් ලැබීම.
- රු. 2 000 තොගයක් මිලදී ගැනීම
- රු. 5 000ක කාර්යාල උපකරණයේ ලබාගැනීම. (ලකුණු 01) (ලකුණු 02)

(ii) (අ) මුදල් ගිණුම - හර 150 000
බැංකු ණය ගිණුම - බැර 150 000 (ලකුණු 01)

(ආ) ණගැති - නිමල්ගේ ගිණුම - හර 6 000
විකුණුම් - බැර 6 000 (ලකුණු 01) (ලකුණු 02)
(වටිනාකම නොමැති නම් ලකුණු 1ක් අඩු කරන්න)

(iii) (අ) 1. රු. 12 000ක තොගයක් ණයට ගැනීම.
2. රු. 8 000ක බැංකු ණය හා රු. 1 000ක පොළිය ඇතුලත් රු. 9 000ක බැංකු ණය වාරිකය ගෙවීම.
3. රු. 10 000ක ණයගැතියන්ගෙන් 2 000ක වට්ටමකට යටත්ව රු. 8 000ක මුදලක් ලැබීම.
4. රු. 5 000ක පිරිවැය වූ තොගයක් රු. 7 500ට අත්පිට මුදලට විකිණීම. (ලකුණු 1/2 x 4 = 2)

(ආ) 1. ආරම්භක හිමිකම = 107 000 (1/2)

| වත්කම් | වගකීම් |
|---|---|
| 200 000 | 150 000 |
| 20 000 | 31 000 |
| 40 000 | |
| 28 000 | |
| 288 000 | 181 000 |

**Answer**

2. A - තොගය 27 000 + ණයගැති 30 000 + මුදල් 34 500 = 91 500 (1/2)
   B - බැංකු ණය - 142 000 (1/2)
   C - හිමිකම - 106 500 (1/2)

(ලකුණු 1/2 x 4 = 2)

(iv)

| දිනය | ඉන්වොයිස් අංකය | සැපයුම්කරු | මුළු වටිනාකම | ලොරි | |
|---|---|---|---|---|---|
| | | | | | (1/2) |
| 05/03 | 05/02 | රුවන් ව්‍යාපාරය | 3 000 | | (1/2) |
| 05/15 | 08/08 | අරලිය ව්‍යාපාරය | 3 500 | | (1/2) |
| 05/31 | | ගැනුම් ගිණුමට හර කළා | 6 500 | | (1/2) |

ගැනුම් ගිණුම

| දිනය | විස්තරය | ස/රි | වටිනාකම | දිනය | විස්තරය | ස/රි | වටිනාකම | |
|---|---|---|---|---|---|---|---|---|
| 05/31 | ණය හිමි ගිණුම | | 6 500 | | | | | (1/2) |

ණයහිමි - රුවන්

| දිනය | විස්තරය | ස/රි | වටිනාකම | දිනය | විස්තරය | ස/රි | වටිනාකම | |
|---|---|---|---|---|---|---|---|---|
| | ණය හිමි ගිණුම | | | 05/12 | ගැනුම් ගිණුම | | 3 000 | (1/2) |

ණයහිමි - අරලිය ව්‍යාපාර

| දිනය | විස්තරය | ස/රි | වටිනාකම | දිනය | විස්තරය | ස/රි | වටිනාකම | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | 05/15 | ගැනුම් ගිණුම | | 3 500 | (1/2) |

නිවැරදි ආකෘතිය සහිත ගිණුම් තුනට (1/2) (ලකුණු 04)

(06) (i) (අ) ඉක්මනින් ගනුදෙනු ගිණුම්ගත කිරීමට හා අවශ්‍ය ගිණුම් වාර්තා ස්වයංක්‍රියව පිළියෙළ කරගැනීමට හැකි වීම නිසා කලය ඉතිරිවීම.
අවශ්‍ය ශ්‍රමය අවම වීම තුළින් මුදල් ඉතිරි වීම.
ස්වයංක්‍රියව නිමවන ගිණුම් වාර්තාවල නිරවද්‍යතාව ඉහළ වීම.
කාලීන දත්ත පහසුවෙන් ලබාගත හැකිවීම. (ලකුණු 01)

(ආ) යම් කාලපරිච්ඡේදයක් අවසානයේ දී (අවසාන දිනට) ලෙජර් ගිණුම්වල හර ශේෂ හා බැර ශේෂ වෙන වෙනම තීරු දෙකක ඇතුලත් කර පිළියෙළ කරන ලැයිස්තුවයි. (ලකුණු 01)

(ii) (අ) වියදම - 8 500කි. (ලකුණු 01)

(ආ) ප්‍රතිපූර්ණය කළ යුතු මුදල් 13 500කි. (ලකුණු 01)

(iii) (අ) (i) කිසියම් කාලච්ඡේදයක් තුළ ව්‍යාපාරය බැංකුව සමග කල ගනුදෙනුවල විස්තර ඇතුලත් කරමින් බැංකුව විසින් ව්‍යාපාරය වෙත එවු ලබන ප්‍රකාශණයකි. (ලකුණු 01)

(ii) බැංකු ගාස්තු
සෘජු ප්‍රේශණ
ස්ථාවර නියෝග මත ගෙවීම් (ලකුණු 01)

(ආ)

සංශෝධිත බැංකු ගිණුම

| | | | | |
|---|---|---|---|---|
| ඉ/ගෙ/ශේෂය | 24 500 | බැංකු ගාස්තු | 750 | (1/2) |
| ණය ගැති | 2 000 | ප/ගෙ/ශේ | 25 750 | |
| (1/2) | 26 500 | | 26 500 | |
| ඉ/ගෙ/ශේ | 25 750 | | | |

| | | |
|---|---|---|
| සංශෝධිත බැංකු ගිණුමේ ශේෂය | (1/2) | 25 750 |
| + නිකුත් කළ ඉදිරිපත් නොවූ චෙක්පත් | 4 000 | 4 000 |
| | (1/2) | 29 750 |
| - තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක් | 3 000 | 3 000 |
| බැංකු ප්‍රකාශණයට අනුව ශේෂය | | 26 750 |

(ලකුණු 02)

පොදු ජ'නලය

(iv)

| | | |
|---|---|---|
| අවිනිශ්චිත ගිණුම - හර | 3 000 | |
| ගෙවූ කොමිස් | | 1 500 |
| ලද කොමිස් | | 1 500 (1/2) |
| (ගෙවූ කොමිස් ලද කොමිස් ලෙස සටහන් වීමේ වරද නිවැරදි කිරීම) | | |
| වැටුප් ගිණුම - හර | 2 000 | |
| මුදල් පොත | | 2 000 (1/2) |
| (වැටුප් ගෙවීම අත්හැරීමෙන් වූ වරද නිවැරදි කිරීම) | | |
| .................. | | |
| අවිනිශ්චිත | | 4 000 (1/2) |
| (විදුලිය ගිණුම ශේෂ පිරික්සුමට නොගැනීමෙන් වූ වරද නිවැරදි කිරීම) | | |
| ගැනුම් ගිණුම - හර | 4 000 | |
| ණයහිමි ගිණුම | | 4 000 (1/2) |
| (ගැනුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන් මගහැරීමෙන් වූ වරද නිවැරදි කිරීම) | | |

අවිනිශ්චිත ගිණුම

| | | | | |
|---|---|---|---|---|
| (1/2) | ඉ/ගෙ/ශේෂය | 1 000 | ශේ. පිරික්සුමේ වෙනස | 4 000 (1/2) |
| (1/2) | ලද කොමිස් | 1 500 | | |
| (1/2) | ගෙවූ කොමිස් | 1 500 | | |
| | | 4 000 | | 4 000 |

(ලකුණු 04)

(07) (i) (අ) ගිණුම් කාලච්ඡේදය කල ව්‍යාපාර විසින් උපයන ලද දළ ලාභය ගණනය කිරීම සඳහා (ලකුණු 01)

(ආ) බොල් ණය ගිණුම හර 3 000

ණය ගැති ගිණුම 3 000 (ලකුණු 01)

(ii) (අ) ලක්ෂණ 2කට ලකුණු 1ක් දෙන්න.

(ආ) වත්කම් වගකීම් හිමිකම් (ලකුණු 01)

(iii)

එකමුතු ව්‍යාපාරයේ 2018/12/31 අවසන් වර්ෂයට (1/2)
ලාභ ලාභ ගිණුම

| | | | |
|---|---|---|---|
| විකුණුම් | | 220 000 | |
| (-) විකුණුම් පිරිවැය | | | |
| ආ. තොගය | 16 000 | | |
| (+) ගැනුම් | 120 000 | | |
| | 136 000 | | |
| (-) අ. තොගය | (260 00) | 110 000 | (1/2) |
| දළ ලාභය | | 110 000 | (1/2) |
| (+) වෙනත් වට්ටම් | | 1 000 | |
| ලද වට්ටම් | | 111 000 | (1/2) |
| (-) බෙදා හැරීමේ වියදම් | | | |
| බොල් ණය | 2 000 | | |
| මෝටර් රථ ක්ෂය (1/2) | 15 000 | | |
| ප්‍රචාරණය | 20 000 | | (1/2) |
| දුන් වට්ටම | 4 000 | 41 000 | |

Answer

| | | | | |
|---|---|---|---|---|
| (-) පරිපාලන වියදම් | | | | |
| වැටුප් | 14 000 | | | |
| ගොඩනැගිලි කුලිය | 4 000 | | | |
| | | | 28 000 | (1/2) |
| (-) මූල්‍ය වියදම් | | | | |
| ණය පොලී | 5 000 | | 5 000 | |
| (-) ශුද්ධ ලාභය | | | | |
| ප්‍රා.ගි. බැර කළ | | | 42 000 | (1/2) |

එකමුතු ව්‍යාපාරයේ 2018/12/31 දිනට
මූල්‍ය තත්ව ප්‍රකාශය (1/2)

| ජංගම නොවන වත්කම් | පිරිවැය | ස.ක්ෂය | ශු. අගය | |
|---|---|---|---|---|
| ඉඩම් | 100 000 | - (1/2) | 100 000 | |
| මෝටර් රථ | 150 000 | 15 000 | 135 000 | |
| | 250 000 | 15 000 | 235 000 | (1/2) |
| **ජංගම වත්කම්** | | | | |
| තොගය | | 26 000 | | |
| ණය ගැතියෝ | | 38 000 (1/2) | | |
| මුදල් | | 35 000 | 99 000 | |
| | | | 334 000 | |
| **හිමිකම හා වගකීම්** | | | | |
| ප්‍රාග්ධනය | | 212 000 (1/2) | | |
| (+) ශුද්ධ ලාභය | | 42 000 (1/2) | 254 000 | |
| **ජංගම නොවන වගකීම** | | | | |
| බැංකු ණය | | 50 000 | 50 000 | (1/2) |
| **ජංගම වගකීම** | | | | |
| ණය හිමියෝ | | 27 000 | | |
| ගෙවිය යුතු ණය පොලී | | 3 000 | 30 000 | (1/2) |
| | | | 334 000 | |